# සීගිරි කුරුටු ගීයෙහි යතිවර නිර්මාණ

පූජ්‍ය කහන්ගමුවේ රාහුල හිමි

**පිවිසුම :-**

ලෝක උරුම ස්මාරකයක් හැටියට ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත්ව ඇති සීගිරිය විශේෂයෙන්ම මධ්‍යම පළාතේ ඓතිහාසිකත්වය වඩාත් තිව්‍ර කරයි. දෙස් විදෙස් පුරාවිද්‍යාඥයන්ගේත්, වාස්තු විද්‍යාඥයන්ගේත්, කලා රසිකයන්ගේත්, නොමද ගවේෂණයට, විචාරයට පාත්‍ර වූ මෙම ස්මාරකය ආශ්‍රිතව දේශීය උරුමයේ තොරතුරු එමටය. රාජකීය උද්‍යාන අතුරින් පැරණි සමය නියෝජනය කරන සීගිරි ක්ෂේත්‍රය දකුණු ආසියාවට තිලකයක් බඳු ය. මේ තුළ පරිසරාත්මක, වාස්තු විද්‍යාත්මක, කලාත්මක ආදී බහු විෂය වූ තේමාවන් අධ්‍යනය කළ හැකිය. උපයෝගීතාව අතින් ආරක්ෂාව කෙරෙහි වැඩි උනන්දුවකින් ඉදිකළ එක්තරා ප්‍රාකාරයක සටහන්ව ඇති ගී "කුරුටු ගී" වශයෙන් හඳුනා ගෙන ඇත. නූතනයේ ඒ ගී අතුරින් 685 කට පමණ අර්ථ දැක්වීමට විචාරකගේ සමත් වී ඇත. විවිධ තරාතිරම්වලට අයත් ලේඛකයෝ සීගිරි පරිසර නිර්මාණයේ ආස්වාදය ගීයකට පරිවර්තනය කළෝය. තත් කතුවරුන් අතර යතිවරුන් පිළිබඳව සටහන් තැබූ ගේය පද පිළිබඳ විසුමක් මෙමගින් නිරූපිත ය.

# සීගිරි කුරුටුගීයෙහි යතිවර නිර්මාණ

සිංහල සංස්කෘතියේ සදාචාරාත්මක මෞලි මංගල්‍යයෙන් පසුව අනුරාධපුර රාජධානි යුගයේ අපට දායාද කළ ප්‍රෞඪ ඉතිහාසයේ වතගොත සුළුපටු නොවේ. ශතවර්ෂ 15 - 16 ක් පුරාවට හෙළ කලා නිර්මාණයේ ප්‍රමුඛස්ථානයක් ගන්නා සීගිරිය සිංහලයාගේ අභිමානය ලොවට ප්‍රදර්ශනය කෙරෙන කැඩපතක් බඳුය. දහ අටවසක් (ක්‍රි.ව. 479 - 497) මෙසිරිලක ඔටුණු දරූ කාශ්‍යප රජු මෙහි නිර්මාතෘවරයා බව වංශ කතාවල සඳහන් වේ. එක්ම සිතකට ගෝචර වූ දෙමගෙක චින්තාවකින් පිතෘ ඝාතක කසුප් රජු කලාකාමි නරපතියෙකු ලෙසින් ජීවත්ව සිය චිත්ත වික්ෂෝපය දුරුකර ගැනීමට ගත් උත්සාහය සීගිරි පව්වෙන් හා අවට පරිසර නිර්මාණයෙන් මනාව දැක ගැනීමට පුළුවන. භෞතිකව මිනිසා ලැබූ දියුණුවක් ආධ්‍යාත්මික නිදහසත්, වික්ෂිප්ත මානසික ආතතියට සෙවූ චිත්ත සමාධියත් සීගිරි පරිසර නිර්මාණයෙන් පැහැදිලිය. සිගිරියෙහි පරිසර නිර්මාණයත්, පන්හිඳෙන් නිපැයු කුරුටු ගීයත්, තෙළි තුඩින් නිර්මාපිත විචිත්‍ර ලලනා රූප දකින කවරෙකුගේ වුවද සිතට නැගෙන්නේ සෞන්දර්යාත්මක ආස්වාදයකි. කුවේරයාගේ ආලකමන්දාවට සීගිරිය සමාන කොට දැක්වීමට මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා මෙහෙය වූ කාරණය වන්නේ ද එහි ශෘංගාරාත්මක නිර්මාණයන්ය.

ආගමට දහමට එතරම් නම්‍යශිලිබවක් නොදැක්වූ කාශ්‍යප රජතුමා තම උපරිම බලය යොදා වීරත්වය රැක ගැනීමට දැරූ තැත සීගිරි මාලිගා පරිශ්‍රයේ නටඹුන් තුළින් විද්‍යාමාන වේ. කලාකාමී රජෙකු ලෙස කාශ්‍යප රජ පිළිගැණෙන බව මහාවංශයෙන්ද කරුණු උපුටා ගනිමින් නිවන්දම ශ්‍රී ධර්ම කීර්ති හිමියෝ සිය "සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය" නම් ග්‍රන්ථයේ දී කාශ්‍යප රජුගේ අනුභූතීන් පිළිබඳ මෙසේ ප්‍රකාශ කරයි.

> "කාශ්‍යපයෝ ආගමට නොව පියාට ද ප්‍රමාණය ඉක්මවා ගරු කළ කෙනෙක් නොවූහ. ඔහු ආත්ම පරිත්‍යාගයෙන් වීරත්වය රැකගත් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් විය. සීගිරිය ආගම භක්තියෙන් යුත් දැහැමි රජෙකුගේ නොව ආගමක් ගැන කිසිම හැඟීමක් නැති කලාකාමී වීරයකුගේ කෘතියක් බව එහි යන්නකුට වැටහෙයි."[1]

ධර්මකීර්ති හිමියන්ගේ තත් ප්‍රකාශය ප්‍රත්‍යක්ෂ වීමට සීගිරියෙහි ඇඳ ඇති ලලනා රූපයන්ම ප්‍රමාණවත් වේ. අජන්තා චිත්‍ර සම්ප්‍රධායට අයත් සේ සැළකෙන සම්ප්‍රදායෙන් නිර්මිත තත් චිත්‍ර ක්‍රි.ව. 05 වන සියවසයේදීම අඳින ලද්දකි. සීගිරි ගීවල පැවසෙන ඇතැම් අර්ථයන් තුළින් එදවස එවැනි සිතුවම් පන්සියයක් හෝ එයට ආසන්න ගණනක් තිබූ බව පැහැදිලිය. සීගිරි පරිසර නිර්මාණයත්,ලලනා රූපත්, වස්තු විෂය කර ගනිමින් ලක්දිව සිව් දිගින් පැමිණි රසඥයෝ කැටපත් පව්රෙහි ගී සනිටුහන් කළහ. අනුරාධපුර යුගයේ හෙළ කවියාගේ අපූර්ව වර්ණනා චාතුර්යය සීගිරි ගීයෙන් මනාව ධ්වනිතය.

අනුරාධපුර යුගයේ සාහිත්‍යයේ ශේෂ වූ ධම්පියා අටුවා ගැටපදය, සියබස්ලකර හා සිඛවලද හා සිඛවල ද විණිස තත් යුගයේ මහා ප්‍රාඥයන්ගේ තත්වය කියා පෑවද සීගිරි ගීය සාමාන්‍ය කලා කරුවාගේ කලා කුසලතාවන් පෙන්නුම් කරයි. උගතුන් මෙන්ම සාමාන්‍ය ජනතාවද සීගිරි පව්වට නැග තම අත්විඳි සුවය කවි සංකල්පනාවකට පෙරළා කැටපත් පව්රෙහි සනිටුහන් කළේය. තම ජීවන අත් දැකීමෙන් ලත් සංකල්ප මුසු කරමින් ලියූ ඇතැම් සීගිරි ගීයක් සිංහල පද්‍ය සාහිත්‍යයේ මහා කාව්‍යයකට සමාන කළ හැකි බව මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතා සිය "සිංහල සාහිත්‍ය I " කෘතියේ දී සඳහක් කරයි. සීගිරිය නැරඹීමෙන් අමන්දානන්දයට පත් කවියෝ තම සිත් සතන්හි පහළ වූ ආනන්දනීය සංකල්පනාවන් ගීයකට පරිවර්තනය කළෝය.

රාග ධ්වනි වශයෙන් හැඳින්විය හැකි භාව ගී විශේෂයක් ලෙසින් අගය කළ හැකි සීගිරි ගී පබැඳුමෙන් මුක්තකයකි. පූර්වාපර අසම්බන්ධතාවෙන් යුත් මුක්තකයක ජීවය ධ්වනිතාර්ථයයි. එක් ගීයකට රසපිරි අදහසක් ඇතුලත් කිරීමේදී කාව්‍ය කරණය පිළිබඳ මනා පරිචයක් අවශ්‍ය වේ. "රස පිරුණු අදහසක් කවියට නගා එක් ගීයෙන් පැවසීමට මනා පරිචයක් වුවමනා වේ. කවි කමෙහි හුරු බුහුටිකමක් නැත්තවුනට එවැනි ගී ලියන්නට නොහැකිය" සීගිරි ගී ලියූවන්ගේ පරිණත කවිත්වය හා ප්‍රතිභාපූර්ණත්වය කෙබඳුදැයි මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතාගේ යට දැක්වූ ප්‍රකාශයෙන් ධ්වනිත වෙයි.

සීගිරි කැටපත් පව්රෙහි පාරිසරික සාධක මත විශේෂයෙන්ම තත් කවියන්ට තම නිර්මාණය එක්ම ගීයකට සීමා කරන්නට සිදුවිය. තම කවි ශක්තිය එමඟින් නිරූපනය කිරීමට ඔවුහු නොපසුබට වූහ. පාඨකයාගේ රසඥතාවට හානි නොවන පරිදි තම වස්තුවිෂය එක් ගීයකට නැඟීමේදී සීගිරි කවියාගේ කවි කමෙහි තරම මොනවට ප්‍රදර්ශනය කෙරේද? කවිකමෙහි දක්ෂතාව මැන ගැනීමට ඇති හොඳම මාර්ගය වන්නේද මුක්තක පබැදුම්ය. ඉදිරියට සඳහන් කළ යුතු කරුණු වලින්මද කාව්‍යයේ රසය ඉදිරිපත් කිරීමට මුක්තකයක ලක්ෂණයයි.

"පූර්වාපරනිරපෙක්‍ෂෙණාපිහි යෙන රස චර්වනා ක්‍රියතෙ තදෙව මුකතකම්"

යනුවෙන් අභිනව ගුප්තාචාර්ය තුමා මුක්තකයක ලක්‍ෂණය අවධාරණය කරයි. මෙයින් ධ්වනිත වන්නේ නොකියූ බොහෝ සංකල්ප කෙරෙහි රසඥයාගේ සිත යොමු කළ යුතු බවයි. වාච්‍යාර්ථය ඉක්මවා ගිය ව්‍යංගාර්ථය දැනවීම මුක්තක ලක්‍ෂණයි. මේ

ගුණයෙන් පිරිපුන් සීගිරි කවියන් පිළිබඳව මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතා මෙසේ ප්‍රකාශ කරයි.

> "කවියා තුළ ඇති වූ රසය හැකිතාක් සංක්ෂිප්ත කර එක ගීයකින් ඉදිරිපත් කිරීමට හැකි නම් එය දුර්ලභ කවි ශක්තියේ ලක්‍ෂණයක් වශයෙන් එකල විසූ කවීන් පිළිගත් බව සිතිය හැකිය. කවියාගේ සිතෙහි ජනිත වූ රසය තුළු ගන්වා එක් ගීයකින් හෝ දෙකකින් ඉදිරිපත් කිරීම සීගිරි ගීවල ප්‍රමුඛ ලක්‍ෂණය වන්නේය."

විවිධ වස්තු විෂය තුළ ගී ලියූ සීගිරි කවියාගේ කාව්‍යකරණයේ විශේෂත්වය පිළිබඳ වැඩිදුර ගවේෂණය කිරීමට මාතෘකා පාඨයෙන් අපට එතරම් අවශ්‍ය නැත්තේය.

ක්‍රි. වර්ෂයෙන් හයවෙනි සියවස සිටම සීගිරි ගී ලියූ බව සමහර සාහිත්‍ය ගවේෂීන්ගේ අදහසයි. එහෙත් උසස් පෙළේ නිර්මාණ දකින්නට ලැබෙන්නේ ක්‍රි.ව. 08 - 10 සියවස්වල රචිත ගී කාව්‍ය තුළින්ය. සීගිරි කැටපත් පව්රෙහි ගී ලියූවන් අතර විවිධ තරාතිරමේ නැනැත්තෝ වූහ. මෙරට සිව් දිගින් සීගිරියට ආ ජනතාව සීගිරි පරිසර නිර්මාණයෙන් විඳි මත්කාරය ගීයකට පෙරළා කැටපත් පව්රෙහි සනිටුහන් කළේය. ලිවීමට අපහසු යමෙක් වකෙකු ලවා ලියූ ගී ද කැටපත් පව්රෙන් හමුවෙයි. උගතුන් මෙන්ම සාමාන්‍ය ජනතාවද කසේ ගී ගියු බව පෙනේ. මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතා සීගිරි ගී ලේඛකයන් මෙසේ දුනාගෙන ඇත.

> "මේ ගී ලියූවන් අතර ද ඒ ලියූ ගී කියවා රස විඳියවුන් අතර ද රජවරුන්, රජකුමරුන්, රජයේ උසස් නිලදරයන්, පැවිද්දන්, ගිහි මිනිසුන්, වනිතාවන් යන නොයෙක් දෙනා සිටියද ඒ ගී පෙළ වැඩියෙන්ම දෙස් දෙන්නේ සාමාන්‍ය මිනිසාගේ රුචිකත්වයටයි."

දැනුමෙන්, වෘත්තියෙන් මෙන්ම විවිධ සමාජ ස්ථරායනයන්ට අයත් නැනැත්තෝ රියෙහි ගී ලියූහ. වෙළෙන්දන් , වෙදදුරන් මෙන්ම රජයේ උසස් නිලතල දැරූ අය ද ඒ ර වෙති. භික්ෂුණීන් වීමෙන් ලියන ලද ගී ද අතරින් පතර හමුවේ. මෙහිදී අපගේ අරමුණ නේ මේ කවියන් අතර පැවිද්දන් නියෝජනය කෙරෙන ගී පිළිබඳ විමසා බැලීමයි.

ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් සීගිරියට පැමිණි භික්ෂූන් සිගිරි පරිසර ණයේ චමත්කාරය ගීයකට පෙරළා කැටපත් පව්රෙහි සනිටුහන් කිරීමට අමතක කළහ. දැනට අරුත් සපයා ඇති ගී 685 න් ගී 40 ක් 50 ක් පමණ නම නම සඳහන් කළ රයන්ගේ නිර්මාණ වේ. බොහෝ කවියන් නම සඳහන් නොකළ නිසා ගී නිර්මාණ කළ ම් යතිවරයන්ද ඒ මඟ අනුගමනය කරන්නට ඇතැයි උපකල්පනය කිරීමට ද පුළුවන. නම් ථෙරවාදී බෞද්ධ සංකල්ප වලින් පෝෂණය වූ ගී ලියූ යතිවරයාණෝ තම නම

සඳහන් කිරීම හිතාමතාම අමතක කරන්නටද ඇත. කාශ්‍යප රජුට ථේරවාදීන්ගෙන් නොලැබුණු සහයෝගය නිසා යතිවර නිර්මාණ කැටපත් පව්රෙහි අල්පවීමට හේතු වන්නට ද ඇත. සාහිත්‍ය හා කලා පෝෂණයෙහිලා පුරෝගාමී වූ භික්ෂූන්ගේ නිර්මාණ සීගිරියෙහි අඩු වීමෙහිලා එවැනි කාරණා කීපයක් බලපෑමද භික්ෂූන්ගේ සීගිරි සපැමිණීම සම්පූර්ණයෙන් නතර නොවූ බව කැටපත් පව්රෙන් පෙනේ. වසර 18 ක රාජධානියක්ව පැවැති සීගිරි රාජ මාලිගාශ්‍රය තුළ බෞද්ධාගමික සංකල්ප නිරූපණය වීමද නැත්තේමසේය. එබැවින් ගී ලියූ භික්ෂූන්ගේ ගණනද අල්ප විය. මේ පිළිබඳ වැඩිදුර ගවේෂණය විද්‍යාර්ථීන්ට භාරය.

සීගිරි ගී කුරුටු ගෑ වෙනත් කවියන්ට මෙන්ම යතිවරයන්ට වස්තු විෂය වූයේද විචිත්‍ර ලලනා රූප පරිසර සුන්දරත්වය හා ශෘංගාරාත්මක වින්දනයයි. ඒ අතර ඇතැම් පැවිද්දෙක් ධර්මානුකූල චින්තාවන්ද ගීයකට පරිවර්තනය කළ තැන් හමු වේ.

සීගිරි ලලනා රූප දැකීමෙන් හටගත් තම චිත්ත වික්ෂෝපය හා ප්‍රමුදිතතාවය ඇතැම් යතිවරයකුගේ ගී නිර්මාණය විය. සීගිරි ලියන්ගේ ළදැසි බව, ඔවුන්ගේ සිතහව කාශ්‍යප රජුගේ වියෝව, රජු මෙලියන් හා විඳි සමහන් සුව ප්‍රියයාගෙන් වෙන් වීමෙන් මුසපත් වූ කාන්තාවන්, කාන්තාවන්ගේ අශ්‍රද්ධාව ආදී විවිධ විෂයික තොරතුරු මෙන්ම සීගිරි අවට පරිසර සෞන්දර්ය ඇතැම් යතිවර ගී නිර්මාණ අතර වේ.

සීගිරියට පැමිණි "අගබෝ" නම් පැවිද්දා පරිසර සෞන්දර්ය විඳි අයුරු ගීයකට නගන්නේ මෙසේය.

"නැඟී අලුයම අවුජ් බලය් සිටියිනි මෙහිමයේ
විඳිමි මඳමරු ගසඑත නමුරු වෙනෙහි සුවන්ද් මෙහි"

"අලුයම අවුත් නැග මේ දෙස බලාසිටි මම මන්ද මාරුතය සමඟ ගසා එන නෙළුම් වනයෙහි සුවඳ මෙහිදී විඳිමි."

මේ ගීය ලියූ කවියා හිමිදිරියෙන්ම සීගිරි පව්ව තරණය කොට ඇත. සීගිරි පව්ව වටා පිහිටි දිය අගල්හි සුපුෂ්පිත නෙළුම් පුෂ්පයන්ගේ සුවඳ මන්ද මාරුතයක් සමඟ පර්වතය තරණය කරද්දී පර්වතයේ සිටියවුන්ට විඩාවක් නොවුණ සේය. ආඝ්‍රාණමය වින්දනය ගීයකට මුසු කොට ඇත. තෙළි තුඩින් නිපැයු විචිත්‍ර රූපයන්ගෙන් උද්දාමයට පත්ව සිටි මෙම කවියාට තත් චිත්ත ප්‍රමුදිත භාවය තිව්‍ර කර ගැනීමට පාරිසරික හේතු බලපෑ බව ඒ ගීයෙන් කියයි.

කිති කසුබු හිමියන් සීගිරිය පිළිබඳ ජවප්‍රවාදය එලෙසින්ම ගීයකට නගා ඇත. සීගිරි ලලනා රූප ගල් බිත්ති මත ඇඳ කාශ්‍යප නරේන්ද්‍රයා මිය ගිය බව සීගිරි ගී ලියූ බොහෝ දෙනෙකුගේ අදහසයි. මුලින් ලියූ ගී කියවා ලැබූ තත් විචාර මාර්ගය එලෙසින්ම ගීයකට නැගීමට යතිවරයා උත්සාහ ගෙන ඇති බව ඔහුගේ ගී නිර්මාණයෙන් පෙනේ.

"නැසැ පරලොව සෙමිවයි රජ මොයුනැ අජවය
ගලට කොට පණයු මසයු වී යි ගියෙක මෞනට"

"නෑසි පරලොව යෙම්වායි සිතමින් කතුන් සිත්තම් කොට තොපි මෙහිම වෙසෙත්වායි කියා රජතුමා මිය ගියේය."

වාර්තා කරන ස්වරූපයෙන් ලියා ඇති මෙම ගීයෙහි අමුතුවෙන් යමක් සිතන්නට ඉඩහැර නැත. තමා අසන ලද්දක් ඒ අයුරෙන්ම පද කීපයක් මගින් ඉදිරිපත් කර ඇත. කාශ්‍යප රජතුමාගේ මරණය පිළිබඳ ගී ලියූ බොහෝ දෙනෙක් දැක ඇති අයුරෙන්ම මෙම යතිවරයාද දැක ඇත. ලලනා රූප ගල් බිත්තියෙහි සතුටින් සිටින්නේ යැයි පැවසීමට කවියා උත්සහ දරා ඇත. ජීවී බවක් ආරෝපණය කිරීමට කවියා උත්සාහ ගත්තද තත් උත්සාහය එතරම් සාර්ථක වී නැත. ක්‍රි.ව. 8 වැනි සියවසට පමණ අයත් යැයි සැලකෙන එම ගීයෙන් යතිවර කවියාගේ කවිකමට වඩා ඔහුගේ වාර්තා කරන ස්වරූපය ඉස්මතු වී ඇති සැටියක් පෙනේ.

"කයබුර" නම් ස්ථානයෙන් පැමිණි "සෙන්" නැමැති යතිවරයා ලියූ ගීය ඉතාමත් කාව්‍යාත්මක ගුණයෙන් යුක්ත ගීයක් ලෙසින් අගය කළ හැකියි. සීගිරි අප්සරාවන්ගේ ලාලිත්‍ය ගුණය උපමාලංකාර මගින් ඉතා සංයමයෙන් යුක්තව දක්වා ඇත. තම පැවිදි බව මෙන්ම කවිකමෙහි, පබැඳුමෙහි සංයරභාවය වී ගීය තුළ ඇතුලත්ය. වස්තුවිෂය ශෘංගාරාත්මක වුවද කවියා තම අදහස් හා හැඟීම් මනා පාලනයකින් යුත්කව කියයි.

"බන්දු බැමැ නිම්පතෙක්හි සන්දහයි එක් වනා
එමු පැරයූ ළඳැරිය තොල්හි ළපලු නා
ළ ගොබ්පතක් බන්දු මහනෙල් ලමු කරනා
ම හය් කල් යෙමෙහළි කී දිගා අත් සලමිනා"

"ඇගේ බැම කොහොඹ පතුයක් බඳුය. ඇගේ මුහුණ චන්ද්‍රයා හා ඒකාකාරය. ළඳැරියගේ තොලින් නා දලුව පරදවන ලදි. මහනෙල් මලක් එල්බෙන අතින් යුතු ළා දළුවක් බඳු පියකරු යෙහෙළි තොමෝ දිගු අත් සලමින් මෙසේ කීවාය."

කවියා යොදාගෙන ඇති උපමා සියල්ල පරිසර සෞන්දර්යයෙන් ගෙන ඇත. තම සිතට ශෘංගාරාත්මක අදහස් නැගීම වලක්වා ගැනීමට කවියා "ළඳැරිය" යන පදය භාවිත කරගෙන ඇත. නිර්මාණාත්මක ස්වරූපයේ හා වර්ණනා මාර්ගයේ අඩුවක් නොවන රසය අවස්ථානුකූලව වහනය කෙරෙන ගී පබැඳුමක් ලෙසින් මේ ගීය අගය කළ හැකිය.

සෙන් පව් නම් ස්ථානයෙන් පැමිණි "දෙව්" නම් පැවිද්දා සීගිරි ලලනා රූප දැකීමෙන් තම සිත පාලනය කර ගැනීමට නොහැකිව උකටලී ස්වභාවයට පත් වූ ආකාරය කැටපත් පව්රෙහි මෙසේ සනිටුහන් වෙයි.

"තමා පැහැන් පැහැයම්නි සිටිමින් ගිරිතෙලේ
වහවම්ද කුම් සෙයින් නො ජැනෙයි දිගැස වර්මන්"

"ගිරි තෙලෙහි සිටිමින් තම පැහැයෙන් තමා පැහැපත් කරමින් සිටින තොප දැකුමෙන් කවර අයුරෙන් වැවෙම්ද? උතුම් පැහැයක් ඇති දිගැසිය එය මට නොදැනේ."

පැවිද්දෙකු වුවත් තම හැඟීම් පාලනය කර ගැනීමට නොහැකි වූ මේ කවියා තම සිතට නැඟුණු අව්‍යාජ කවි සංකල්පනාව එලෙසින්ම ගීයට නඟා ඇත. හැඟීම් යටපත් කරගෙන සිටි කවියා තව දුරටත් එසේ කිරීමට නොහැකි වූ තැන තැන අදහස ගීයකට පරිවර්තනය කොට ඇත. වෙනත් කවියන්ට මෙන්ම මෙම යතිවරයාටද වස්තු විෂය වී ඇත්තේ සීගිරි අප්සරාවන් හා ඔවුනගේ දැකුම්කළු ස්වභාවයයි. ස්වභාවෝක්තියාලංකාරයට අනුගතව තත් පබැඳුම නිර්මාණපිතයි.

විශේෂයෙන්ම සීගිරිය නැරඹීමට ආ යතිවරුන් අතර කීප දෙනෙක්ම සීගිරි අප්සරාවන් දැකීමෙන් තම හදවතේ ඇති වූ ආකුල ව්‍යාකුල ස්වභාවය එලෙසින්ම ගීයකට පරිවර්තනය කොට ඇත.

"බුද්මිත්" නම් පැවිද්දා තමා නොදැනුවත්ම මේ අප්සරාවන්ගේ වසඟයට ගිය බව මෙසේ ප්‍රකාශ කරයි.

"දැක තරවෙයි ලත සෙයින් හෙලිල්ලම්බුයුනත්
පණයියන් සිට සිහිලස බැලුම් බලයි ලොලුප හර්නා"

"රූමතියන් දැක ඔවුන් ලබාගත් නිසා ඔහු ප්‍රීතියෙන් උදම් වෙයි. එහි සිට පෙම්වතුන් ආකර්ශනය කරවන, ආශාව දනවන, සිහිලස් බැලුම් හෙලයි."

සීගිරි අප්සරාවන්ගේ මඳහසට තමන් වසඟ වූ බවත් ඔවුන් තමන්ගේ ආකර්ශනයට භාජනය වූ බවත් "බුද්මිත්" නම් යතිවරයා කියයි. භික්ෂුත්වයේ සංකල්පනාවන් තුළ පමණක් නතර නොවී සීගිරි ලලනා රූප දැකීමේදී එයින් ඔබ්බට ගමන් කර ඇති බවක් පෙනේ. පෙම්වතුන්ගේ ජවනිකා සිහියට නැඟුණු මේ යතිවරයාට සීගිරි ලලනා රූප එම අදහසේ හැසිරීමට ඉඩහැර ඇති බවක් පෙනේ. කසාවකින් ගත සරසා ගෙන සිටියත් මානුෂික හැඟිම් කොපමණ යටපත් කරගෙන සිටියත් යම් විටෙක එම අදහස් ඉදිරිපත් වී එන බව යට දැක්වූ ගී නිමාණකරුවන් දෙනොගේම අදහස් වලින් පෙනේ. සාමාන්‍ය මිනිස් ගතිවල ස්වරූපය නියම අයුරෙන් එළි දැක්වීමට මේ ගී ලියූ යතිවරයෝ උත්සාහ ගෙන ඇත. නිදහස්වීම තම සිතට නැඟුණු සංකල්පනා ගීයකට පෙරළා ඇත. සමාජ සම්මුති යදම් විට ඉවතලා නිදහස් තම අදහස් ප්‍රකාශ කළ යතිවරයෝ දෙදෙනෙකු ලෙස මේ ගී ගියු යතිවරයන් දෙදෙනා හඳුනා ගැනීමට හැකියි.

සෞන්දර්ය බුදු දහමේ හරවත් සංකල්ප සමඟ මුසු කරමින් ගී ලියු පැවිද්දෝද සීගිරි කැටපත් පව්රෙන් හමුවෙති. ශෘංගාරය මෙන්ම ආනන්දනීය සංකල්ප තුළ සැපය තාවකාලික බවත් ඒ තුළ ඇත්තේ සදාකාලික අනිත්‍ය බවත් ගී ලියු බොහො යතිවරුන්ගේ අදහස් අතර වෙයි. ත්‍රිලක්ෂණ ධර්මතාවට අනුව සිත මෙහෙයවමින් වින්දනයන් තුළ නතර

විය යුතු බව පාඨකයාට අවබෝධ කර දෙන්නට ඇතැම් ගී ලියූ යතිවරයෙක් උත්සාහ ගෙන ඇත. එවැනි අරුත් ඇති සීගිරි ගී කිපයක්ම හමුවුවද ඒ සියල්ල මෙහි සඳහන් කිරීම උගහටය. පහත සඳහන් ගී කීපට පමණක් නිදසුන් වශයෙන් බලන්න.

"මෙසෙ සිති පහසක් සෙවී මුළ රුවහි එතරිසි
යෙත මුළ එළෙ සෙ වූ නුබ සිරිබර්නි පින්සබර් ජන්ම"

"රූපයෙහි මුලා වී ආශාව එත්ම මෙසේ මේ කාන්තාව රූප පහස් සඳහා යෝග්‍ය යැයි තොප විසින් සිතන ලද්දේය. ආශාව අහසට දැමූ යමක් පොළොවට වැටෙන්නා සේ මුලාව වැටෙයි. ඔවුන්ගේ සිරිබරින් පුණ්‍ය සම්භාරය දනිමු."

"සෙන්" යම් යතිවරයා මේ කියන්නේ පංචස්කන්ධයේ අනිත්‍ය ස්වභාවයයි. ආශාව සියලු දුකට හේතුව බව ප්‍රකාශ කරන්නේ ධර්මයේ ගැඹුරු තැන් සිහියට නගාලීමෙනි. සංයමයෙන් තම අදහස ප්‍රකාශ කොට ඇත. එසේම මේ පැවිද්දා සීගිරි ලලනාරූප වලට ජීවි බවක් ආරෝපණය කොට ඇත. ඔවුන් ගිය ආත්ම භාවයන්හීදි කරන ලද පුණ්‍ය සම්භාර ධර්මයන්ගේ මහිමයෙන් මේ අත් බැව්හිදි යස ඉසුරින් හා සිරිබරින් යුක්ත විය. කවියා මේ ගීයේ සෑම අංශයකින්ම ධර්මාන්විත අදහස් තිව්‍ර කිරීමට ගත් උත්සාහයක් දැක ගත හැකිය. තෘෂ්ණාව ශෝකයට මුල්වන බවත්, කරන ලද පින් ඇති බව වාසනාවට හේතු වන බවත් කියන කවියා පාඨකයාට මතක් කර දෙන්නේ වස්තුවෙහි ලෝබ නොකොට පින් දහම් රැස්කර ගත යුතු බවයි. "තිස්" නම් යතිවරයා ලියූ ගීයද මේ හා සමග අරුත් සපයයි. ජලයේ අඳින ලද රේඛාවක් ස්ථිර නොවන්නා සේ සියල්ල අනිත්‍ය බවට පත්වෙයි. කාශ්‍යපයෝ තොපගේ අල්ප වූ වරදකින් තොප අමතක කර දැමුවේද එලෙසිනි යි කියන කවියා පාඨකයාට යමක් සිතා ගන්නට ඉඩහැර ඇත.

"සියි වෙජ් මැකෙයි දයෙනිදිලි පියන් ගෙ වෙයි දතුද
කෙලෙසින් කිපි වෙයි තොප වරජක්නි යම්තම් ගුණ මුහුරද්"

"ජලයේ අඳින ලද රේඛාවක් වන කල්හිම මැකෙයි. ප්‍රියයා එම වරද දන්නාවුද ගුණ සාගරයක් බඳු වූ බණකින් කෙලෙසින් කිපෙන්නේද"

යහපත් වූ සත්පුරුෂයෝ කරන ලද අල්ප වූ ද උපකාරය අමතක නොකරති. දුර්ජනයෝ කළ උපකරණය ක්ෂණිකව අමතක කරති. එසේම කාශ්‍යප රජතුමා මේ ගුණවත් කාන්තාවන්ගේ සියලු ගුණයන් පසෙක දමා සුළු වැරැද්දකින් පවා ඔවුන් අමතක කොට මිය පරලොව ගිය බව කවියා ව්‍යංගයෙන් කියයි. එපමණක් ද නොව සියලු සංඛ්‍යා ධර්මයන්ගේ ක්ෂණ භංගත්වය මතක් කර දෙන කවියා ත්‍රිලක්ෂණ ධර්මතාව මෙනෙහි කටයුතු බව පාඨක ජනතාවට මතක් කර දෙයි. ලලනාරූප දෙය ශෘංගාරව නොබලා භික්ෂු සංකල්ප වලය ගැලපෙන සංකල්පනාවන්ගෙන් යුතුව තමන් නිර්මාණය ඉදිරිපත් කිරීමට මේ කවිවර යතිවරයාණෝ වගබලා ගෙන ඇත. සෞන්දර්යට යටින් දිවෙන්නා වූ යථා ස්වරූපය

මනාව හඳුනාගෙන තත් යථාභූත ඥාණය පාඨකයාට කියා දෙන්නට ගත් උත්සාහය එම ගීයෙන් මනාව ධ්වනිතය.

"රියන්සෙන්" නම් පැවිද්දා තම උකටලී වූ සිතට අස්වැසිල්ලක් ලබා ගැනීම පිණිස සීගිරියට පැමිණ ඇත. සීගිරි ලලනා රූප බැලීමෙන් තම චිත්ත වික්ෂේපය බලයත් වූ බව කනස්සල්ලෙන් යුතුව ගීයකට නගා මෙසේ ඉදිරිපත් කරයි.

"උකැටැලි වී අයිම් උකටලි බලවට නැවත
තුප උකැටැලි දිනි බෙයදහි රනවනනි නොබණ"

"උකටලීව මෙහි ආමි. මෙය බලන්නවුන්ටද උකටලි බව ජනිත කරවන ලදි. බෙයදෙහි රන්වන් ලියෙහි නො බණනු මැනවි"

සිත්තම්ගත කාන්තාවන්ගෙන් බසක් නොලද කවියා එයින් තරමක වින්දනයක් ලබයි. යම් විදියකින් මේ කාන්තාවන් බසක් දුන්නේ නම් එය ද මේ කවිවර යතිවරයන්ට තව තවත් ශෝක ගෙන දෙන්නක් බව කවියාගේ හැඟීමයි. මේ කවියා ජීවිතයේ යම් පැතිකඩක් පිළිබඳව වික්ෂෝපයෙන් ජීවත් වූවෙකි. සමහර විටෙක භික්ෂු ජීවිතය පිළිබඳව ඇති වූ කනස්සලු ස්වභාවයක් විය හැකිය. සෞන්දර්යාත්මක වූද ශෘංගාරාත්මක වූද සීගිරි අප්සරාවන් දැකීමෙන් කවියාගේ උකටලී බව වර්ධනය වූයේ කවරක් නිසාද යන්න පාඨකයාට හිතා ගැනීමට ඉඩ හැර ඇත. කවර අයුරකින් රීති ප්‍රශ්න ඇති වුවද කවියා තම සිතට නැඟුණු අව්‍යාජ සිතිවිල්ල නොබියව ප්‍රකාශ කොට ඇත. බෙයදෙහි සිටි රන්වන් ලියන් මේ යතිවරයන්ගේ සිත්ගත් බවද එම ගීයෙන් ප්‍රකාශිතය.

සීගිරි අප්සරාවන් නොබිණීම ඇතැම් පැවිද්දෙකුට සිත් ගෙන දුන්නද ඇතමෙකුට එය සතුටට කරුණක් නොවීය. සීගිරි නැරඹීමට ආ "මහදෙව්" නම් පැවිද්දා බසක් නොදොඩන සීගිරි කතුනට දෝෂාරෝපණය කරන්නේ මෙසේය.

"බිණුවන් අග්නත් නොබණනු වරජෙකි මෙසෙයි
තමන් අතඳු හිමි නොමළ තද්ළ ඇත්තෙන් හට් කී වරජය"

"බැණවුවද මෙසේ කතුන් නොබිණීමෙ වරදෙකි. තද සිත් ඇත්තන් නිසා හිමියා මළේ නොවේද? යනුවෙන් එල්ල කළ චෝදනාව තමන් කෙරෙහිම පවරා ගත්තේ වන"

සීගිරියට පැමිණි පිරිස සීගිරි අප්සරාවන්ට එල්ල කරන චෝදනාව කවියා මෙහිදී සාධාරණීකරණය කරයි. කාශ්‍යප නරේන්ද්‍රයා මිය ගියේ මේ කතුන් නොදොඩන නිසා බව ඇතැම් කවියෙක් කියයි. එම පුරාණෝක්තියේ සාධාරණී බව කවියා මෙහිදී ප්‍රකාශ කරන්නේ දැඩි සිත් ඇති අප්සරාවන්ට දොස් නැගීමේ අයුරෙනි. සීගිරි අප්සරාවන්ගෙන් වදනක් බලාපොරොත්තු වූ කවියා රය නොලැබුණු තැන තම සිතට ඇති වූ හැඟීම ගීයකට පෙරළා කැටපත් පව්රෙහි සනිටුහන් කළේය.

සීගිරි අප්සරාවන්ට ඇලුම් කිරීම නිෂ්ඵල කාර්යයකි. බිතුසිතුවම් කෙරෙහි ලොල් වූ

ජනතාවට එහි නිස්සාරත්වය පැහැදිලි කර දෙන්නට ගත් උත්සාහයක් වශයෙන් "සලමෙයි" පැවිද්දාගේ ගීය අගය කළ හැකිය. වක්‍රෝක්ත්‍යාලංකාරය යොදා ගනිමින් උපහාස රසය කුළු ගන්වමින් ලියූ එම ගීය කවියාගේ විවිධ විෂයික ඥානය ප්‍රකට කරවයි.

"සරා සිසි රැස්නි පුම්බුදී වැජැ මී සින්දු
ජු කන්දු කලා හැනැ රිස සෙයි නොකා මුළා"

"මහ සයුර සඳ රැසින් පිම්බි පොළවෙහි හැපී දූපත් කඳු ඉවුරු ආදියෙහි ඇනී තම රිසිය හරියි. මුළා වූ කවරෙකුට නිබන්දක් සිදු නොවේද"

පංචකාම සම්පත්තියෙහි ලොල් වූ තැනැත්තේ රිසිසේ එය වින්දනය කරයි. උත්සාහවත් විය යුතු මාර්ගය පසෙක තිබියදී වෙනත් මාර්ගයක උත්සුක වීම සුදුසු නොවන බව කවියා ප්‍රකාශ කරන්නේ ව්‍යංගයෙනි. උපහාසය මෙන්ම ධර්මාන්විත උපදේශයක්ද මේ ගීයෙන් ධ්වනිතය. සාර්ථක, සරල උපමාවෙන් කරුණු පැහැදිලි කර දීමට ගෙන ඇති උත්සාහය සාර්ථකය.

සෞන්දර්යාත්මක ආස්වාදයක වින්දනය ගීයකට නැඟූ යතිවරයන් මෙන්ම බුදු දහමේ ගැඹුරු දාර්ශනික සංකල්ප ගීයකට නැඟූ යතිවරයන්ද සීගිරි කැටපත් පව්රෙන් හමුවෙයි. කර්මය හා අනිත්‍ය, පුනර්භවය වැනි අදහස් ගීයකට නැඟූ යතිවරයෝ එමගින් උපදේශයක්, අවවාදයක් සැපයීමට උත්සාහ ගත්හ. ඇතැම් යතිවරයෙක් තමන් විඳි ශෘංගාරාත්මක අදහස නොපැකිලිව ඉදිරිපත් කළේය. විවිධ අලංකාර උපයෝගී කරගත් ඇතැම් යතිවරයෙක් අතින් ලියවුණු ගීය මහා කාව්‍යයකට සමාන කළ හැකිය. උසස් නිර්මාණ ශක්තියෙන් යුත් පබැඳුම් යතිවර ගී නිර්මාණ අතර දැක ගැනීමට පුළුවන. සමහර විටෙක වාර්තා කථන ස්වරූපයෙන් ලියූ යතිවර නිර්මාණද දැක ගැනීමට පුළුවන. සාමාන්‍ය ජන විඥාඥාණය නොඉක්මවා වෙනත් කවියන් මෙන්ම සීගිරියට පැමිණි යතිවරයන්ද කැටපත් පව්රෙහි තම අදහස කුරුටු ගෑවේය.

විශේෂයෙන්ම සීගිරියට පැමිණි වෙනත් කවියන්ට මෙන්ම යතිවරයන්ටද වස්තු විෂය වූයේ සීගිරි ලලනා රූපයි. සීගිරි අප්සරාවන්ගේ ළදැයි බව, නොදෙඩීම, කාශ්‍යප රජුගේ වියෝව ආදී හේතු මෙන්ම පරිසර සෞන්දර්ය වර්ණනා ද ඒ අතර වේ. අප්සරාවක් දැකීමෙන් ආශක්ත වූ පැවිද්දන්ද ආශක්ත වීමේ ආදීනව පහදා දෙමින් ධර්මොපදේශ සපයන පැවිද්දන්ද සීගිරි කැටපත් පව්රෙන් හමුවෙයි.

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේදී කවියන් හතර වර්ගයකට බෙදා දක්වා ඇත. එනම්

"චින්තා කවි, සුත කවි, අත්‍ථ කවි, පටිභාන කවි"[17] යනුවෙනි"

අද්භූත භාවරූපයේ කවියන් චින්තා කවියන්ය. චින්තනයට අමතරව පොතපත කියවීමෙන් ලත් දැනුම ඇතිව කවි නිපදවන්නේ සුත කවියන්ය. වස්තු විෂයට මූලිකත්වය

දෙන්නේ අත්‍ථ කවියාය. දර්ශනය හා සෞන්දර්ය තර සම්බන්ධතාව දකිමින් කවි ලියන්නේ පටිභාන කවියන්ය. මේ සතර වර්ගයටම අයිති පැවිද්දන් සීගිරි කැටපත් පවුරෙන් හමුවෙයි. සිංහල සාහිත්‍යයේ ඉතිහාසය ගවේෂණය කරන උගතුන්ට සීගිරි කුරුටු ගී වැදගත් සන්ධිස්ථානයකි. එහිදී යතිවරයාන්ගෙන් ලැබුණු දායකත්වය සුළුපටු නොවේ. විවිධ දක්‍ෂතාවන්ගෙන් යුක්ත භික්‍ෂූන් සීගිරිය තරණය කොට තම සිතට නැගුණු අව්‍යාජ සිතිවිලි ගීයකට පෙරළා කුරුටු ගෑවේය. අද එම නිර්මාණ ජාතියේ ජීවය ලෙසින් විවිධ විද්‍යාර්ථන්ගේ ගවේෂණයට භාජනය වෙයි.

විවිධ සාහිත්‍ය නිර්මාණයේ පුරෝගාමීන් ලෙස කටයුතු කළ පැවිද්දෝ සීගිරි කුරුටු ගී සාහිත්‍යයෙන්ද පැණෙති. ඔවුහු සමාජ සම්මුති යදම්පට ඉවතලා ස්වාධීන වූහ. ඇතමෙක් සම්මුතිය තුළ හිඳිමින් ගී ලියූහ. කෙසේ වෙතත් උසස් නිර්මාණ ශක්තිය පළ කරන ගී යතිවර පබැඳුම අතර වෙයි. සීගිරි කුරුටු ගී සාහිත්‍ය පෝෂණය කළ යතිවරයන් පිළිබඳ විද්‍යාර්ථීන්ගේ අවධානය යොමු වී නැති අතර ඒ පිළිබඳ විධිමත් පර්යේෂණයන් සිදු කිරීම තත් කවිවර යතිවරයන්ට කෙරෙන ගෞරවයක් විය හැකිය. ජාතියේ ජවයට පෝෂණය ලබාදුන් භික්‍ෂූහු විවිධ අයුරෙන් සීගිරි පරිසරය වස්තු විෂය කරගනිමින් කැටපත් පවුරෙහි ගී ලියූහ. සාහිත්‍ය නිර්මාණයේ භික්‍ෂුවගේ අනන්‍යතාව තහවුරු කෙරෙමින් අනාගත පරපුරටද සීගිරි කැටපත් පවුර පර්යේෂණ භූමිකාවක් වනු ඇත. තත් භූමිකාවේ විශිෂ්ඨ පර්යේෂණයන් සීගිරි කුරුටු ගී නිර්මාණය කළ යතිවරයන්ටද ගෞරවයක් වනු නොඅනුමානය.

## පාදක සටහන්

(1) ධර්ම කීර්ති ශ්‍රී නිවන්දම, සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, තෙවැනි මුද්‍රණය - 2002, පිටු අංක 30.

(2) කුලසූරිය, ආනන්ද. සිංහල සාහිත්‍ය I, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව : තෙවැනි මුද්‍රණය 1999, පිටු අංක 254

(3) - එම - සිංහල සාහිත්‍ය I, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව. තෙවැනි මුද්‍රණය 1999, පිටු අංක 255

(4) මුදියන්සේ නන්දසේන, සීගිරි පද්‍යාවලිය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ : දෙවන මුද්‍රණය - 2004, පිටු අංක 30

(5) - එම - පිටු අංක 29 , 30

(6) කුලසූරිය, ආනන්ද. සිංහල සාහිත්‍ය I, පිටු අංක 256

(7) මුදියන්සේ, නන්දසේන. සීගිරි පද්‍යාවලිය, පිටු අංක 155

(8) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 183

(9) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 363

(10) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 335

(11) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 365

(12) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 443 - 444

(13) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 463 - 464

(14) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 215

(15) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 383

(16) - එම - සීගිරි පද්‍යාවලිය, පිටු අංක 402

(17) අංගුත්තර නිකාය, (P.T.S) චතුක්ක නිපාතය, කවි සූත්‍රය පිටු අංකය 230